ඉන්දු ලංකා ගිවිසුම (1987 ජූලි- 2007 ජූලි):

# අවස්ථාවක්ද? බලහත්කාරයක් ද?

## සුනන්ද දේශප්‍රිය

ඉන්දු ලංකා ගිවිසුම නිරනුමානවම මෑත කාලීන ශ්‍රී ලංකාවේ ජනවාර්ගික ප්‍රශ්නය විශයයෙහි වඩාම විවාදයට ලක් වූ සංසිද්ධීන් අතුරෙන් එකකි.

එය ඉතිහාසයේ විනිශ්චය විසින් තබනු ඇත්තේ කුමණ ස්ථානයක ද?

එදා බෞද්ධ භික්ෂුන්ගේ සහ විරුද්ධ පාක්ෂිකයින්ගේ විරෝධතාවයන් විසින් පරාජය කරන ලද නමුත් 1959 බණ්ඩාරනායක චෙල්වනායගම් ගිවිසුම අද ඉතිහාසය විසින් සාධාරණ කරනු ලැබ තිබේ. එදා ඒ ගිවිසුම රට බෙදීමේ ද්‍රෝහී ගිවිසුමක් ලෙස හැදින් වූ නමුත් අද කිසිවකු එසේ කියන්නේ නැත.

## 1987 ජූනි 27 දා කොළඹ

1987 ජූලි 29 දා කොළඹ මෑත කාලයේ දුටු දැවැන්තතම විරෝධතාවය අත් දැක්කේ ඉන්දු ලංකා ගිවිසුමට එරෙහිවය. **ඊට ශ්‍රීලනිප ය, එජාපයේ ප්‍රේමදාසවාදි කණ්ඩායම සහ ජවිපෙ එක්ව සිටිය හ.**

1987 මැයි 18 දා ඇරඹි යාපනය අල්ලා ගැනීමේ ශ්‍රී ලංකා හමුදාමය විමුක්ති මෙහෙයුම සාර්ථක ලෙස ඉදිරියට ගමන් කිරීම මැයි 26 දි ඇරඹි ය. ඉන්දියාව මෙම මෙහෙයුම ගැන සතුටට පත්ව සිටියේ නැත. මෙම තත්ත්වය තුළ ඉන්දියාවේ සිට යුද්ධයෙන් අනාථ වූ යාපනයට සහනාධාර රුගත් බෝට්ටු පෙළක් කන්කසන්තුරෙයි වරාය වෙත පැමිනෙමින් තිබෙන බව ජූනි 03 දා වාර්තා වූයේ ය.

ඉන් අනතුරුව එළඹි දින ගෙවී ගියේ ශ්‍රී ලංකා නාවික හමුදාවේ යුද නැව් විසින් එම බෝට්ටු පළවා හැරීමේ වීරෝධාර සිරස්තල සමගිනි. ඊට පෙර සිටම කොළඹ ඉන්දියානු තානාපති කාර්යලය ඉදිරිපිට ආණ්ඩු පාක්ෂික නළුනිළි ගායික ගායිකාවෝ එක් දිනෙක ද නීතිඥ පිරිස් තවත් දිනෙක ද යනාදී වශයෙන් නිතිපතා පැවැති විරෝධතා සියළු ජනමාධ්‍යයන්ගේ ශිර්ෂපාඨ බවට පත් ව තිබුණි.

සහනාධාර බෝට්ටු නතර කිරීමට පිළිතුරක් ලෙස ජූනි 04 දින ඉන්දියානු ගුවන් හමුදාව යාපනයට අහසින් සහනාධාර හෙළිමේ මෙහෙයුම දියත් කළේ ය. විමුක්ති මෙහෙයුම නැවතුනි. ජූනි 25 දින සිවස්තවා ඉන්දීය නෞකාව කන්කසන්තුරෙයි වරායට සහනාධාර ටොන් 25ක් ගොඩ බෑවේ ය. මේ වන විට ආණ්ඩුවේ ආශිර්වාදය ඇතිව මෙරට දේශපාලනඥයින් සහ ජනමාධ්‍ය පෙර නොවී විරූ ඉන්දීය විරෝධයක් ගොඩ නගමින් තිබුණි. **යුද උන්මාදය අද මෙන් ඉහළටම නැගී තිබුණි.**

ඉන්දු ලංකා ගිවිසුම අත්සන් කෙරුණේ මෙම විරෝධතා ව්‍යාපාරයන් ඇරඹී මසක් ගතවෙත්දී ය. ගිවිසුමට එජාප අගමැති වූ ප්‍රෙමදාස එළිපිටම විරුද්ධ වූ අතර ආරක්ෂ ඇමැති වූ ලලිත් ඇතුළත්මුදලි නිහඩ විරෝධයක් දැක්වීය.

ඉන් පෙනෙන්නේ ඉන්දු ලංකා ගිවිසුම ඇතිවූයේ ම අසුභ අවස්ථාවක දී බවයි. එය ඇතිවූයේ එහි අන්තර්ගතය පිළිබඳව කිසිදු සංවාදයකින් තොරව ය. **ඕනෑම දේශපාලන ක්‍රියාදාමයක් සාර්ථක වීමට නම් ප්‍රතිඵලය පමණක් නොව ක්‍රියාදාමය ද ඉතා වැදගත් ය. විශේෂයෙන් ම**

**සාමය ඇති කිරීමට දැරෙන ප්‍රයත්නයන්හි දී ඒ කරා යන මාවත ඉතා වැදගත් සහ තීරණාත්මක බව යළි යළි ඔප්පු වී තිබේ.**

## විජය මරා දැමීම

අනෙක් අතට ඉන්දු ලංකා ගිවිසුමට සහාය දීමට සිටි සහ ජනමතයක් ගොඩ නැගීමට හැකියාව තිබූ ප්‍රබලතම දේශපාලන බලවේගය වූයේ වාමාංශික එක්සත් පෙරමුණ යි. මන්ද යත් ජේ ආර් පාලනය ඒ වන විට පිරිහී තිබූ නිසා ය. **වාමාංශික එක්සත් පෙරමුණේ ජනප්‍රිය නායකයා වූ විජය කුමාරතුංගට වෙඩි තබා මරා දැමූ ජනතා විමුක්ති පෙරමුණ එම බලවේගය එක රැයින් දුබල කළේ ය.**

ඉන්දු ලංකා ගිවිසුමට එරෙහිව ජවිපෙ දියත් කළ පුද්ගල ඝාතන දේශපාලනය ගිවිසුමට සහාය දැක්වූ දේශපාලන පක්ෂයන්හි ක්‍රියාකාරීන් දහස් ගණනාවක් බිලි ගත්තේ ය. චන්ද්‍රිකා කුමාරතුංග රට හැර ගිය පසු මහජන පක්ෂයට අනුහස් සහිත නායකත්වය නැතිව ගියේ ය. සමසමාජ සහ කොමියුනිස්ට් පක්ෂ සිය නායකයින් බිලි ගන්නා ජවිපෙ භීෂණය හමුයේ නිද්‍රාවට පත් විය. සාමය උදෙසා ක්‍රියාකාරී වූ සිවිල් සමාජ පිරිස් ද එකී භීෂනයේ ගොදුරු බවට පත්ව නොමැරී නාමාකව පමණක් පවතින තත්ත්වයට පත් විය.

පසු කාලයක ජවිපෙ විසින් ම පිළිගත්තේ එම භීෂනය මෙහයවූ ජවිපෙ නායකත්වය දුන් දේශප්‍රෙමී ජනතා ව්‍යාපාරට එජාප ප්‍රෙමදාස කණ්ඩායමෙහි ද සහාය ලැබුණු බව යි. විරුද්ධ බලවේග කඳවුරු බැඳ තිබුණි.

ඉන්දු ලංකා ගිවිසුම අලුතින්ම සකස් කළ එකක් නොවී ය. එහි අන්තර්ගතය සකස්ව තිබුනේ ඊට පෙර තිම්පු යනාදී සාකච්ඡා ගණනාවක දී සාකච්ඡා වූ කරුණු මත ය. එනමුත් ඒ පිළිබඳව කිසිදු සාකච්ජාවක් සංවාදයක් ගොඩ තිබුනේ නැත.

## අර්ධ ෆෙඩරල් ක්‍රමයක්

ඉන්දු ලංකා ගිවිසුමෙහි දීර්ඝකාලීන ප්‍රතිඵලය වූයේ 13වන සංශෝධනය මගින් පළාත් සභා ක්‍රමය ඇති කිරීම යි. ඒකාබද්ධ කෙරුණු උතුරු නැගෙනහිර පළාත් සභාව දෙමළ ජනයාට යම් තරමක ස්වයං පාලනයක් ලබා දීමට ඉඩකඩ සළසා තිබුනි. **එය අර්ධ ෆෙඩරල් ක්‍රමයක් වූ අතර එහි ෆෙඩරල්වාදී ස්වභාවය ක්‍රියාවට නැංවීම මධ්‍යම ආණ්ඩුවෙහි කැමැත්ත සහ අධිශ්ඨානය මත රඳවා තිබුණි.**

උතුරු නැගෙනහිර දෙපලාත් එක් කිරීම සහ එය දෙමළ ජනයාගේ ඉතිහාසිය වශයෙන් ජීවත් වූ භූමි ප්‍රදේශ වශයෙන් පිළි ගැනීම ඉන්දු ලංකා ගිවිසුම පිළිගැනීමට දෙමළ සන්නද්ධ කණ්ඩායම් පෙළඹ වූ ප්‍රධාන ලක්ෂණය විය.

අනෙක් අතට ශ්‍රී ලංකාව නොබෙදුනු රාජ්‍යයක් වශයෙන් පිළිගැනීම සහ 13 වන සංශෝධනය මගින් පාර්ලිමේන්තුවේ අධිකාරයට පළාත් සභා ක්‍රමය යටත් කිරීම සිංහළ බහුතර ආණ්ඩුවට දෙන ලද සම්මුතිය විය.

ගිවිසුම ක්‍රියාවට නැංවීම පිණිස ඉන්දියානු සාම සාධක හමුදාවක් පැමිණීම ගිවිසුම බලාත්මක කිරීමේ පදනම විය. අර්ධ බලහත්කාකමක් ලෙස ඉන්දියාවට කැඳවන ලද එල්ටීටීඊ නායක ප්‍රභාකරන් ගිවිසුමට එකග වූයේ කැමැත්තෙන් නොවේ. එනමුත් ගිවිසුම අත්සන් කිරීමෙන් පසු අගෝසතු 04දා සුදුමලෙයි දී පැවැති දැවැන්ත මහජන රැස්වීමක් ඇමතූ ප්‍රභාකරන් තමන් ගිවිසුම පිළිගන්නා බව කියා සිටියේ ය. **නමුත් ප්‍රභාකරන් කියා සිටියේ තමන් මෙම තීරණයට ආවේ කැමැත්තෙන් නොව ඉන්දියාවේ බලපෑම නිසා බව යි.**

ඉන් අනතුරුව එවකට එල්ටීටීඊ නායකයකු වූ යෝගී විසින් සංකේතාත්මක ආයුධ බාර දීමක් ද කළේ ය. ගිවිසුමට අනුව සියළුම සන්නද්ධ කණ්ඩායම් සිය ආයුධ පැය 72ක් තුළ බාර දිය යුතු විය. අනෙත් අතට සිරකරුවන් නිදහස් කිරීම වැනි ආණ්ඩුව විසින් ගත යුතු වූ පියවරයන් ද යම් දුරකට ක්‍රියාවට නැගුණි.

## ගැටුම ඇරඹේ

එසේ නමුත් ආණ්ඩුව ගිවිසුම අනුව සිය යුතුකම් ඉටු නොකරන්නේ යැයි එල්ටීටීඊ ය යාපනයේ උද්ඝෝෂන ආරම්භ කළ අතර එහි ප්‍රතිපලයක් වශයෙන් ඇරඹි උපවාසයෙන් තිලීපන් ජීවිතක්ෂයට පත් විය. මෙම උද්ඝෝෂණය යාපනයේ දේශපාලනය සාම සාධක හමුදා විරෝධී මාවතකට යොමු කිරීමේ ආරම්භය විය.

අගෝස්තු සැප්තැම්බර් මාසය අවිනිශ්චිත ය ගෙවී ගිය නමුත් තීරණාත්මක කඩඉම පැමිණියේ අන්තර් වාර පාලන මණ්ඩලය සහ එහි සභාපතිවරයා පත් කිරීමේදී ය. එල්ටීටීඊයට තිදනෙකු පමණක් සිටි හත්දෙනෙකුගෙන් සමන්විත එම මණ්ඩලය 13 දෙනෙකු දක්වා වැඩි කිරීම මගින් එම ප්‍රශ්නයේ කොටසක් විසදන ලද නමුත් සභාපති ගැටුම ඉතිරි විය.

ජනාධිපති ජේ.ආර් ජයවර්ධන එල්ටීටීඊය අපේක්ෂා කළ ත්‍රිමලයේ හිටපු දිසාපති ඇන්. පත්මනාදන් මහතා සභාපති ලෙස වෙනුවට යාපනේ මහ නගර සභා කොමසාරිස් සී.වී.කේ.සිවඥානම් මහතා පත් කළේය. **දේශපාලන ගැටුම උච්චාවස්ථානයකට පත් විය.**

ඔක්තෝබර් 04දා මුහුදින් ගමන් කරමින් සිටි එල්ටීටීඊ නායකයින් 17 දෙනෙකු ශ්‍රී ලංකා හමුදාව විසින් අත් අඩංගුවට ගන්නා ලදී. කොළඹට ගෙන ඒමට දරන ලද උත්සාහයට විරුද්ධව ඔව්හු සියළු දෙනාම සයනයිඩ් කා සිය දිවි නසා ගත්හ. **ඉන්දීය සාම සාධක හමුදාව සහ එල්ටීටීඊ ය සමග යුද්ධය විවෘතවම ඇරඹුනි.**

එසේ වෙතත් ඉන්දීය හමුදා උතුරු නැගෙනහිර සමස්ත පාලනය සිය අණසකට ගැනීමෙන් පසු ගිවිසුම අනුව 1988 මැද භාගයේ දී පළාත් සභා මැතිවරණය පවත්වන ලදී. සාධාරණ සහ නිදහස් නොවූ එම මැතිවරණයෙන් උතුරු නැගෙනහිර බලය ඉන්දියානු හිතවාදී ඊපීආර්එල්එෆ් සංවිධානයට හිමි විය. ප්‍රේමදාස ආණ්ඩුවේ පසමිතුරු ආකල්ප හමුයේ ටික කලකින්ම ඉන්දියානු යුද බලය මත රදා පැවැතීමට බල කෙරුණු එම පළාත් සභාව සුජාතභාවය නැති කර ගත්තේ ය. අවසානයේ දී ඊපීආර්එල්එෆ් සංවිධානයේ අවසානය ද එයම බවට පත් විය.

## ජවිපෙ ඉල්ලීම්

ඉන්දු ලංකා ගිවිසුම මුල් කරගෙන ජවිපෙ ඇරඹූ සිවිල් යුද්ධය දකුණ ගිනිලමින් තිබුනි. **ජවිපෙ ප්‍රධාන ඉල්ලීම වූයේ ඉන්දු ලංකා ගිවිසුම අහෝසි කිරීම, ඉන්දියානු හමුදාව ආපසු යැවීම, සහ නව ජාතික ආණ්ඩුවක් පිහිටුවීම යි.**

1888 ජනාධිපතිවරනයෙහි එජාප අපේක්ෂකත්වය ප්‍රේමදාස මහතාට ලැබුණේ ජේ.ආර්. ගේ කැමැත්තට වඩා එකී දේශපාලන සන්දර්භය යටතේ ජනතාවාදී අපේක්ෂකයා ලෙස ඔහු පෙනී ගිය නිසා ය. බලයට පත් ඔහු වහාම ඉන්දීය විරෝධී ස්ථාවරයක් ගත්තේ ය. ජවිපෙ සමග සාකච්ජා ආරම්භ කර ජවිපෙ සැකකරුවන් දහස් ගණනාවක් නිදහස් කළේ ය.

## බලය එල්ටීටීඊ යට

ජනාධිපති ප්‍රේමදාස උත්සාහ කලේ සිය බල පදනම ලෙස ජවිපෙ සහ එල්ටීටීඊ ය සමග සන්ධානයකට ගමන් කිරීමට යි. ඒ වෙනුවෙන් ඔහු එල්ටීටීඊ යට ඉන්දීය හමුදාව සමග සටන් කිරීමට ආරක්ෂාව ලබා දී අවිආයුධ සහ මුදල් පවා පරිත්‍යාග කළේ ය. ජවිපෙ කෙරෙහි ඔහු

දැක්වූයේ මුදු ආකල්පයකි. **අවසානයේ දී ජනාධිපති ප්‍රේමදාස විසින් ඉන්දියානු හමුදාව ආපසු යවන ලදී. එල්ටීටීඊ ය උතුරු නැගෙනහිර බලය අල්ලා ගත්තේ ය.**

ඉන්දු ලංකා ගිවිසුමෙහි වූ බලය බෙදීමේ අන්තර්ගතය සහ එය බලාත්මක කිරීම සඳහා වූ ඉන්දියානු කැපවීම ශ්‍රී ලාංකික දේශපාලනයේ දුර දිග නොදුටු පටු අවශ්‍යතා විසින් යටපත් කරන ලද්දේ එලෙස ය. තීක්ෂණ දේශපාලන නායකත්වයක් ලැබුණේ නම් ගිවිසුම සතුව එක්කෝ එල්ටීටීඊ ය දේශපාලනය ප්‍රවාහයට එක් කර ගැනීමේ හෝ නැත්නම් එය තිරණාත්මක යුදමය පරාජයකට යැවීමේ විභව ශක්තිය තිබුණි.

**අනෙත් අතට ආණ්ඩුව දකුනේ දී පළාත් සභා ව්‍යුහයන්ට බලය ලබා දීමට මහත් අකමැත්තක් පෙන්නුම් කළේ ය.** එමගින් පළාත් සභා ක්‍රමය සාර්ථක විමට තිබූ ඉතිරි ඉඩ ප්‍රස්ථාවන්ද නැතිකර දැමුනි. එම ක්‍රියා දාමය අද කොතෙක් දුරට ගමන්කර ඇත්තේ ද යත් පළාත් සභා ක්‍රමය කෙරෙහි ජනතාවගේ කිසිදු විශ්වාසයක් නැත.

## අතහැරුණු අවස්ථා

ශ්‍රී ලංකාවේ ජනවාර්ගික ප්‍රශ්නය අත හැරුණු අවස්ථාවන්ගේ එකතුවකි. 1959, 1996, 1987, 2000. සහ 2002 එම අතහැරුනු අවස්ථාවන්ගේ කැපී පෙනෙන උදාහරණ වෙති. ඉතිහාසය ඉබේ දිවෙන සරළ රේඛාවක් නොවේ. එය දුර දක්නා දේශපාලන බලවේග සහ කෘතහස්ත නායකයින් විසින් හැඩ ගස්වනු ලබන ක්‍රියා දාමයකි. ගිවිසුම් වලට වඩා වැදගත් වන්නේ එම ගිවිසුම් නම්‍යශීලීව, ඉවසීමෙන් යුතුව අවංක හැගීමෙන් ක්‍රියාවට දැම්මට සූදානම් දේශපාලන බලවේග සහ නායකත්වයන් ය.

ශ්‍රී ලංකාවෙහි දී එවැනි කිසිදු තිරණාත්මක සහ සාධනීය දේශපාලන බලවේගයක් හෝ නායකත්වයක් ජනවාර්ගික ප්‍රශ්න හමුවෙහි දක්නට ලැබී නැත. අප අත්දැක ඇත්තේත් අත්දකිමින් සිටින්නේත් විනාශකාරී බලවේග විසින් කපා කොටා දමනු ලබන ඉතිහාසයකි.

යහපත් සිතින් සාමයට එළඹියේ නම් ආරම්භක ස්ථානයක් ලෙස දෙපාර්ශවයම තෘප්තිමත් කර හැකි රාමුවක් ඉන්දු ලංකා ගිවිසුම සතුව පැවැතුණි. සමහර විට කළක් යනතුරු දෙමළ සහ සිංහල ජනයාට එකග විය හැකි අවම දේශපාලන රාමුව වශයෙන් පවතිනු ඇත්තේ මෙම ගිවිසුම යි.

එය එක්තරා අන්දමක බලහත්කාරයකි. නමුත් එම අවස්ථාවේදී ම එය අවස්ථාවක් ද බවට පත් විය. ඉතිහාසයේ මෙවැනි උදාහරණ අප දැක තිබේ. කාම්බෝජයේ වියට්නාම් මැදිහත් වීම (1978) සහ උගන්ඩාවෙහි ටන්සානියානු මැදිහත් වීම  (1978) එවැනි අවස්ථා දෙකකි.

**එනමුත් එල්ටීටීඊ සංවිධානය ඊට කිසිදු එකගතාවයක් නොපෙන්වයි. වත්මන් ආණ්ඩුව ජනමත විචාරණයක් මගින් පළාත්සභා ක්‍රමය අහෝසි කිරීමට උත්සාහ දරයි.**

ඉන්දු ලංකා ගිවිසුමෙහි දසවන සංවත්සරය අවස්ථාව පෙන්නුම් කරන්නේ එහි අරමුණ වූ ජනවාර්ගික ගැටළුවට දේශපාලන විසඳුමක් සොයා ගැනීමෙහි ලා ශ්‍රී ලංකාව ඇදහිය නොහැකි තරම් ආපස්සට ගමන් කර ඇති අන්දම ය.

නිමි.